සැ. යු. - 2012.06.15 දින පළ වූ අංක 1763 දරන ගැසට් පත්‍රයේ I:III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,764 - 2012 ජූනි 22 වැනි සිකුරාදා - 2012.06.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1102 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1103 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 ජූනි මස 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 ජූනි මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පළාත් පාලන නිවේදන

## කටුනායක - සීදුව නගර සභාව

### නගර සභා බල ප්‍රදේශය තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ දෙවැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවැනි වගන්තිය යටතේ පළාතේ පළාත් පාලන ආයතන විෂය භාර ගරු අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා විසින් සම්පාදනය කර 2011 ජූලි 05 වැනි දින අංක 1713/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇති ඉහත කී අතුරු ව්‍යවස්ථාව කටුනායක සීදුව නගර සභාවට පිළිගෙන වැළඳ ගැනීමට සුදුසු බවට 2011 දෙසැම්බර් මස 23 වැනි දින නගර සභා මාසික රැස්වීමේ දී සභා සම්මත කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ලලන්ත ගුණසේකර,
ගරු සභාපති,
කටුනායක - සීදුව නගර සභාව.

2011 දෙසැම්බර් මස 23 වැනි දින දී ය.

06-666/1

## කටුනායක - සීදුව නගර සභාව

### නගර සභා බල ප්‍රදේශය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ දෙවැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවැනි වගන්තිය යටතේ පළාතේ පළාත් පාලන ආයතන විෂය භාර ගරු අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා විසින් සම්පාදනය කර 2011 ජූලි 05 වැනි දින අංක 1713/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇති ඉහත කී අතුරු ව්‍යවස්ථාව කටුනායක සීදුව නගර සභාවට පිළිගෙන වැළඳ ගැනීමට සුදුසු බවට 2011 දෙසැම්බර් මස 23 වැනි දින නගර සභා මාසික රැස්වීමේ දී සභා සම්මත කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ලලන්ත ගුණසේකර,
ගරු සභාපති,
කටුනායක - සීදුව නගර සභාව.

2011 දෙසැම්බර් මස 23 වැනි දින දී ය.

06-666/2

---

## ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

### ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 252 අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 37(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 252 අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 37(1) ආ වගන්තිය ප්‍රකාරව බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව විසින්, අංක 1565 හා 2008.08.29 දිනැති *ගැසට් පත්‍රයේ* පිටු අංක 1503 හි අනුඅංක 7 යටතේ සහ එහි සංශෝධනයක් වන අංක 1626 සහ 2009.10.30 දිනැති *ගැසට් පත්‍රයේ* පිටු අංක 1722 හි අනු අංක 7 යටතේ, පහත සඳහන් මං මාවත ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවට අයත් බවට ප්‍රකාශයට පත් කරන්නට යෙදුන නිවේදනය අවලංගු කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශාන්තා පී. ලියනගේ,
නාගරික කොමසාරිස්,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව.

2012 ජූනි මස 08 වැනි දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා කාර්යාලයේ දී ය.

| *අනු. අංකය* | *පාරේ නම* | *මායිම් සීමාව සිට දක්වා* | *දිග අඩි* | *පළල අඩි* |
|---|---|---|---|---|
| 01 | ඔබේසේකරපුර අභිනවාරාම පාර අංක 29 දරන අතුරු මාර්ගය | ව. අ. 29 සිට 29/5 දක්වා | 219 | |

06-865

# විවිධ දැන්වීම්

## බළපිටිය ප්‍රාදේශීය සභාව

*පෙරසැරි ගාස්තු, සේවා ගාස්තු ආවරණ අනුමැතිය ලබා දීමේ ගාස්තු*

බළපිටිය ප්‍රාදේශීය සභා බල සීමාව තුළ සිදුකරනු ලබන සංවර්ධන කාර්යයන්ගේ හා ඉඩම් අනුබෙදුම් මත අයකරනු ලබන පෙරසැරි ගාස්තු, සේවා ගාස්තු හා ආවරණ අනුමැතිය ලබා දීමේ ගාස්තු නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ බලතල ක්‍රියාත්මක බල ප්‍රදේශයන්ට පොදුවේ අදාල වන පරිදි 2012.04.01 වැනි දින සිට සංශෝධනය කර පහත උපලේඛනයේ පරිදි අයකිරීමට 2012.02.21 දිනැතිව බළපිටිය ප්‍රාදේශීය සභා මාසික මහා සභා රැස්වීමේ දී යෝජනා සම්මත වූ බව මෙයින් දන්වමි.

ඒ. දයාරත්න ද සිල්වා,
සභාපති,
බළපිටිය ප්‍රාදේශීය සභාව.

2012 මාර්තු මස 12 වැනි දින,
ප්‍රාදේශීය සභාව,
බළපිටිය.

### *උපලේඛනය*

***සංවර්ධන අවසරපත්‍ර ලබාගැනීම සඳහා පෙරසැරි ගාස්තු, ආවරණ අනුමැතිය දීම සඳහා ගාස්තු සහ සේවා ගාස්තු***

| *සංවර්ධන කාර්යයයේ ස්වභාවය* | *භාවිතා කළ යුතු ආකෘති පත්‍රය* | *අයකළ යුතු ගාස්තු* | | |
|---|---|---|---|---|
| (1 ) සංවර්ධන අවසර පත්‍ර නිකුත් කිරීම | | *පෙරසැරි ගාස්තු :* | | |
| (i) ඉඩම් අනු කොටස් බෙදීම | "අ" | (i) *බිම් කට්ටියක ප්‍රමාණය* | *එක් බිම් කට්ටියකට අයකළ යුතු මුදල (මාර්ග කාණු හා පොදු බිම් කොටස් හැර)* | |
| | | වර්ග මීටර් 150-300 අතර | රු. 500 | |
| | | වර්ග මීටර් 301-600 අතර | රු. 400 | |
| | | වර්ග මීටර් 601-900 අතර | රු. 300 | |
| | | වර්ග මීටර් 900 ට වැඩි | රු. 200 | |
| (ii) ගොඩනැගිලි ඉදිකිරීම/පවත්නා ගොඩනැගිලි වලට අලුතින් කොටසක් එකතු කිරීම/නැවත ඉදි කිරීම | "ආ" | (ii) *ගෙබිමේ විශාලත්වය වර්ග මීටර්වලින්* | *පදිංචිය සඳහා* | *වාණිජ හෝ වෙනත් භාවිත* |
| | | | *රු.* | *රු.* |
| | | 45 ට අඩු | 500 | 1,000 |
| | | 46-90 දක්වා | 1,500 | 2,000 |
| | | 91-180 දක්වා | 2,500 | 3,000 |
| | | 181-270 දක්වා | 3,500 | 4,000 |
| | | 271-450 දක්වා | 4,500 | 6,000 |
| | | 451-675 දක්වා | 5,500 | 8,000 |
| | | 676-900 දක්වා | 6,500 | 10,000 |
| | | 901-1,225 දක්වා | 7,500 | 12,000 |
| | | 1,225ට වැඩි | 7,500 | 12,000 |
| | | ව. මී. 1,226ක් ඉක්මවීමෙන් පසු සෑම ව. මී. 90ක් සඳහාම රු. 1,000 බැගින් | ව. මී. 1226 ඉක්මවීමෙන් පසු සෑම ව. මී. 90ක් සඳහාම රු. 1,250 | |
| (iii) මායිම් තාප්ප/ආරක්ෂක බැම් ඉදිකිරීම | | | | |
| *ගොඩනැගිලි සීමාවෙන් පිටත | | (iii) *නේවාසික දික් මීටර් 1ක් සඳහා ගාස්තුව* | *වාණිජ හා වෙනත් වර්ග දික් මීටර් 1ක් සඳහා* | |
| *ගොඩනැගිලි සීමාව තුළ | | | | |
| | | 300 0 | 400 0 | |
| | | 500 0 | 600 0 | |
| (iv) ඉඩම්/කුඹුරු ගොඩකිරීම | | (iv) ව. මී. 150ට අඩු රු. 1,500ක් සහ එයට වැඩි සෑම ව. මී. 150කට රු. 1,000 ක් බැගින් | | |
| (v) දුරකථන කුළුනු/ඇන්ටෙනා කුළුනු ඉදිකිරීම | | (v) උස මීටර් 5-20 දක්වා රු. 20,000 ක් සහ වැඩි වන සෑම මීටර් එකකටම රු. 100 බැගින් | | |

| *සංවර්ධන කාර්යයයේ ස්වභාවය* | *භාවිතා කළ යුතු ආකෘති පත්‍රය* | *අයකළ යුතු ගාස්තු* |
|---|---|---|
| (vi) විශේෂ ව්‍යාපෘති සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම | | (vi) රුපියල් මිලියන 5කට රු. 5,000 සහ වැඩිවන සෑම රුපියල් මිලියන එකකට රු. 100 බැගින් |
| 2. නේවාසික සඳහා වූ ඒකකයක භාවිතය වෙනස් කිරීම | “ආ” | (i) *පෙරසැරි ගාස්තු :*<br>*ගෙබිම් ප්‍රමාණය (වර්ග මීටර්)* — *රු.*<br>45ට අඩු — 500<br>45-90 දක්වා — 1,000<br>91-180 දක්වා — 1,250<br>181-270 දක්වා — 1,500<br>271-450 දක්වා — 1,750<br>451-675 දක්වා — 2,000<br>676-900 දක්වා — 2,250<br>900ට වැඩි — 2,250<br>වර්ග මීටර් 901 ට වැඩිවන එක් එක් වර්ග මීටර් 90 සඳහා රු. 500 බැගින් |
| 3. මූලික සැලසුම් නිරාකරණ අනුමැතිය | “අ ” | *පෙරසැරි ගාස්තු :* — රු. |
| (i) ඉඩම් අනුබෙදුම් සඳහා | | * වර්ග මීටර් 1,000ට අඩු ඉඩම් සඳහා — 2,000<br>*වර්ග මීටර් 1,001-5,000 දක්වා — 5,000<br>*වර්ග මීටර් 5,001-10,000 දක්වා — 10,000<br>*10,000 සිට වැඩි වන සෑම වර්ග මීටර් 1,000 කටම — 1,000 බැගින් |
| (ii) ගොඩනැගිලි ඉදිකිරීම/ අළුතින් එකතු කිරීම/ නැවත ඉදිකිරීම | i<br>i | i *නේවාසික* — *වාණිජ හා වෙනත්*<br>රු. 2,000 — රු. 5,000<br>රු. 1,500 — රු. 3,000<br>*ව. මී. 150ට අඩු ඉඩම් සඳහා — රු. 2,500<br>*ව. මී. 151 සිට 300 දක්වා — රු. 5,000<br>*ව. මී, 301 ට වැඩිවන සෑම ව. මී. 150කටම3,000 බැගින් |
| (iii) මායිම් තාප්ප/ආරක්ෂක බැමි ඉදිකිරීම | “ඇ” | i* උස මී. 5-20 දක්වා — රු.20,000<br>උස මීටර් 20ට වැඩි සෑම මීටර 1ක් සඳහාම — රු. 100 බැගින් |
| (iv) ඉඩම්/කුඹුරු ගොඩකිරීම සඳහා | “ඇ” | i* කුඩා පරිමාණ රු. මිලියන 5 අඩුවන ව්‍යාපෘති — රු.10,000<br>* මධ්‍යම පරිමාණ රු. මිලියන 5-50 අතර ව්‍යාපෘති — රු.50,000<br>* මහා පරිමාණ රුපියල් මිලියන 50ට වැඩි ව්‍යාපෘති — රු.1,50,000 |
| (v) දුරකථන/විදුලි සංදේශ කුළුණු<br>(vi) විශේෂ සංවර්ධන ව්‍යාපෘති | “ඇ” | |
| 4. අනුකූලතා සහතික නිකුත් කිරීම (සෑම ඉදිකිරීමක්/සංවර්ධනයක් සඳහාම අනුකූලතා සහතිකය ලබාගත යුතුයි.) | “ඈ” | *අනුකූලතා සහතිකය ප්‍රදානය කිරීමේ ගාස්තු :* |
| (i) ඉඩම් අනුබෙදුම් | | (i) පළමු බිම් කොටසකට රු. 1,000 ක් හා ඊට වැඩිවන සෑම බිම් කට්ටියකටම රු. 500 බැගින් |
| (ii) *නේවාසික ඉදිකිරීම්<br>*වාණිජ හා වෙනත් ඉදිකිරීම් | | (ii) ව. මී. 300ට අඩු රු. 3,000 සහ ඊට වැඩිවන සෑම ව. මී. 1කට රු. 10 බැගින්<br>ව. මී. 100 ට අඩු රු. 3,000ක් සහ ඊට වැඩිවන සෑම ව. මී. 1කට රු. 20 බැගින් |
| (iii) මායිම් තාප්ප/ආරක්ෂක බැමි ඉදිකිරීම | | (iii) පළමු දික් මීටර 100 සඳහා රු. 1,000ක් සහ ඊට වැඩි වන සෑම ව. මී. 1කට රු. 10 බැගින් |

| *සංවර්ධන කාර්යයයේ ස්වභාවය* | *භාවිතා කළ යුතු ආකෘති පත්‍රය* | *අයකළ යුතු ගාස්තු* |
|---|---|---|
| (iv) ඉඩම්/කුඹුරු ගොඩකිරීම සඳහා | | (iv) ව. මී. 150ට අඩු රු. 3000 සහ ඊට වැඩිවන සෑම ව. මී. 1කට රු. 20 බැගින් |
| (v) දුරකථන/විදුලි සංදේශ කුළුනු | | (v) උස මීටර් 5 සිට 20 දක්වා රු. 2,000 සහ ඊට වැඩි වන සෑම මීටර් 1කට රු. 100 බැගින් |
| (vi) විශේෂ ව්‍යාපෘති | | රු. ශත<br>(vi) කුඩා පරිමාණ සඳහා 5,000<br>මධ්‍යම පරිමාණ සඳහා 10,000<br>මහා පරිමාණ සඳහා 20,000 |

5. මෝටර් රථ නවතා තැබීමේ ස්ථාන
(නා. සං. අධිකාරි නියෝග යටතේ සංවර්ධන ස්ථානය තුළ නියම කර ඇති නමුත් එහෙත් සපයා නැති එක් මෝටර් රථයක් නවතා තබන ස්ථාන සඳහා සේවා ගාස්තු)

*සේවා ගාස්තු* :

| | |
|---|---|
| *සැහැල්ලු වාහන හා කාර් | 500,000 |
| *ලොරි | 10,00,000 |
| *කන්ටේනර් ඇතුළු විශාල වාහන | 25,00,000 |
| *සියලුම වාහන සඳහා | 2,50,000 |

(i) කොළඹ මහ නගර සභාව
(ii) වෙනත් මහ නගර සභා
(iii) නගර සභා ප්‍රාදේශීය සභාව

6. ආවරණ අනුමැතිය ලබාදීම

*ආවරණ අනුමැතිය දීම සඳහා ගාස්තු* :
*එක් එක් බිම් කොටස සඳහා රු. 750ක ගාස්තුවක්*

(i) නිසි බලපත්‍රයක් නොමැතිව ඉඩම් අනුබෙදුම් කිරීම

| (ii) නිසි සංවර්ධන බලපත්‍රයකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම/කොටස් එකතු කිරීම/නැවත ඉදි කිරීම | නේවාසික ව. මී. 1ක් සඳහා ගාස්තු රු. | වාණිජ හා වෙනත් ව. මී. 1ක් සඳහා ගාස්තු රු. |
|---|---|---|
| *ඉදිකිරීමේ අදියර :* | | |
| *අත්තිකාරම් වැඩ පමණක් (කයිරු මට්ටම) සම්පූර්ණ කොට ඇති විට | 200 | 500 |
| *වහල මට්ටම දක්වා (වහලය රහිතව) ඉදිකොට ඇති විට | 300 | 1,000 |
| *වහලය ඇතුළුව ඉදිකොට ඇති විට | 400 | 1,500 |
| *සම්පූර්ණයෙන් ඉදිකොට ඇති විට | 500 | 2,000 |
| (iii) මායිම් තාප්ප/ආරක්ෂක බැමි ඉදිකිරීම | 400 | 400 |
| (iv) ඉඩම්/කුඹුරු ගොඩ කිරීම සඳහා | සෑම වර්ග මීටර් 150 කට රු. 5,000 බැගින් | |
| (v) දුරකථන /විදුලි සංදේශ කුළුනු සඳහා | සෑම වර්ග මීටර් 05 කට රු.10,000 බැගින් | |
| (vi) විශේෂ සංවර්ධන ව්‍යාපෘති | සෑම මිලියන 05කටම රු. 10,000 බැගින් | |
| (vii) අනුකූලතා සහතිකය නොමැතිව පදිංචිවීම/ භාවිතා කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම | එක් දිනකට රු. 50 බැගින් | |

7. *පදිංචිය සඳහා වූ ඒකකයක් වෙනත් බිම් කාර්යයක් පිණිස භාවිතා කිරීම සඳහා ගාස්තු :*

(i) අදාළ දේපළ මූලික වශයෙන් පදිංචිය සඳහා වූ විශේෂ ප්‍රාථමික නේවාසික කලාපයක පිහිටා ඇති විට, පදිංචිය පිණිස වූ ඒකකයක් වෙනත් යම් කාර්යයක් සඳහා පරිවර්තනය කිරීමට වර්ග මීටරයකට රු. 2,000 බැගින් ;

(ii) අදාළ දේපළ වෙනත් විශේෂ නේවාසික නොවන යම් කලාපයක පිහිටා ඇති විට පදිංචිය පිණිස වූ ඒකකයක් වෙනත් යම් කාර්යයක් සඳහා පරිවර්තනය කිරීමට වර්ග මීටරයකට රු. 800 බැගින් ;

8. නියමිත ගෙබිම් ප්‍රමාණ අනුපාතයට වැඩි අතිරේක ගෙවීම් ප්‍රමාණයක් සඳහා ඉඩදීමට :-

සේවා ගාස්තු ගොඩනැගිල්ල ඉදිකිරීමේ අදියරවල ප්‍රතිශතයක් ලෙස ගණනය කළ යුතු ය. එකී ප්‍රතිශතය පහත දැක්වෙන සාධක පදනම් කොටගෙන 40%සිට 10% දක්වා වෙනස් විය හැකිය ඃ

(i) ගොඩනැගිල්ල පිහිටා ඇති ස්ථානය;
(ii) ලබාගත හැකි පොදු කාර්යය පහසුකම්වල තත්වය;
(iii) සංවර්ධන වර්ගය;
(iv) වටපිටාවේ බලපෑම;
(v) සංවර්ධන සැළැස්මක් සකස් කර ඇති නම් කලාපීය පිහිටීම.

මේ ගණනය කිරීම සඳහා සැලකිල්ලට ගනු ලබන ගොඩනැගිලිවල අවම පිරිවැය පහත දැක්වෙන අගයන්ට අඩු නොවිය යුතුය :-

| | *වර්ග මීටරයකට රු.* |
|---|---|
| (i) පදිංචිය සඳහා වූ නිවාස | 20,000 |
| (ii) මහල් 04ක් දක්වා වූ පදිංචිය සඳහා වූ නිවාස, වාණිජ සහ කාර්යාල ගොඩනැගිලි | 30,000 |
| (iii) මහල් 04කට වඩා වැඩි පදිංචිය සඳහා වූ නිවාස, වාණිජ සහ කාර්යාල ගොඩනැගිලි | 60,000 |
| (iv) සැහැල්ලු කර්මාන්ත සඳහා වූ ගොඩනැගිලි | 45,000 |
| (v) ගුදම් | 30,000 |

9. *සේවා සැපයීම, වාර්තා සැපයීම හෝ වෙනත් සේවා කටයුතු සඳහා ඃ*

(i) මූලික සැළසුම් නිරාකරණ අනුමැතිය, සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම, අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා ගමනාගමන වියදම් සංවර්ධනකරු දැරිය යුතු අතර ඒ අදාළ කාර්යාලය පිහිටි ස්ථානයේ සිට යෝජිත ස්ථානයට ඇති දුර ගණනය කර කිලෝමීටර් 01කට අවමය රු. 35ට අඩු නොවිය යුතු ය. එහෙත් ඉන්ධන මිලෙහි වෙනස්වීම් කාලීනව ගැළපීම් කර ගැනීමේ හිමිකම් ඇත.

(ii) *විශේෂ උපදේශක සේවා සැපයීම* - වින්‍යාස සැළසුම් සකස් කිරීම, ඇස්තමේන්තු පිළියෙල කිරීම, ව්‍යාපෘති සැළසුම් සකස් කිරීම හා වෙනත් උපදේශක සේවා සඳහා ඇස්තමේන්තුගත මුදලින් 10%ක අවම සේවා ගාස්තු අයකළ යුතු ය.

(iii) ආවරණ අනුමැතිය සඳහා අයකරනු ලබන සේවා ගාස්තු, විවෘත ප්‍රදේශ සඳහා අයකරනු ලබන 10% තක්සේරු වටිනාකම, වාහන නවතා තැබීම සඳහා ඉඩකඩ වෙන් නොකිරීම වෙනුවෙන් අයකරනු ලබන සේවා ගාස්තු වෙන වෙනම ගිණුම්වල තැන්පත් කළ යුතු අතර, ඒවා යොදා ගත යුත්තේ විවෘත ප්‍රදේශ සංවර්ධනය, වාහන නවතා තබන ස්ථාන සංවර්ධනය, පදික වේදිකා සකස් කිරීම හෝ පොදු නාගරික සංවර්ධන ව්‍යාපෘති සඳහා පමණි.

06-778

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.